ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

## මානව හිමිකම් නිලධාරි - III තනතුරට බඳවාගැනීම - 2024

## ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මානව හිමිකම් නිලධාරි III තනතුරේ පවතින පුරප්පාඩු වෙනුවෙන් ස්ථිර පදනමින් බඳවා ගැනීමට දැනට ස්ථිර රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්වය ලබයි.

### සුදුසුකම් :-

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයක නීති/සමාජ විද්‍යා/ගැටුම් නිරාකරණය/ජාත්‍යන්තර සම්බන්ධතා හෝ ක්ෂේත්‍රයට අදාළ විෂයන් සහිත වූ ප්‍රථම උපාධියක් ලබා තිබීම සහ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

2. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවු. 45 ට නොවැඩි විය යුතුය.

3. විශිෂ්ට චරිතයකින් හෙබි අයෙකු විය යුතුය.

4. ශ්‍රී ලංකාව තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවයක් තිබිය යුතුය.

### වැටුප් පරිමාණය :-

MA 5-1-2016 (රු. 34,870-10x660-15x755-11x930-63,025)

මීට අමතරව මූලික වැටුපෙන් 25% දීමනාවක් හා ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

### බඳවාගැනීමේ ක්‍රමය :-

- පහත දැක්වෙන කරුණු යටතේ පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සුදුසු අයවලුන් තෝරාගනු ලැබේ.

| | | |
|---|---|---|
| අදාළ අතිරේක අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් | - | ලකුණු 30 |
| අදාළ අතිරේක පළපුරුද්ද | - | ලකුණු 30 |
| වෙනත් සුදුසුකම් | - | ලකුණු 15 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | - | ලකුණු 25 |

- සුදුසු අයවලුන් තෝරා ගැනීමේදී, අයදුම්කරු විසින් සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණ, අයදුම්කරු විසින් ඉල්ලා සිටිනු ලබන සේවා ස්ථානය හා පුරප්පාඩු සංඛ්‍යාව (භාෂා මාධ්‍යයට අනුව) සළකා ප්‍රමුඛතාවය සකස් කරනු ලැබේ.

| සේවා ස්ථානය | පුරප්පාඩු සංඛ්‍යාව (භාෂා මාධ්‍යයට අනුව) | | මුලු පුරප්පාඩු ගණන |
|---|---|---|---|
| | සිංහල | දෙමළ | |
| 1. ප්‍රධාන කාර්යාලය - කොළඹ | 1 | 1 | 2 |
| 2. වවුනියාව | 1 | 0 | 1 |
| 3. යාපනය | 0 | 1 | 1 |
| 4. ත්‍රිකුණාමලය | 1 | 0 | 1 |
| 5. කල්මුනේ | 0 | 1 | 1 |
| 6. හැටන් | 0 | 1 | 1 |
| 7. මන්නාරම | 0 | 1 | 1 |
| 8. රත්නපුර | 1 | 1 | 2 |
| 9. පුත්තලම | 1 | 0 | 1 |
| එකතුව | 5 | 6 | 11 |

ඉහත පරිදි සුදුසුකම් ලැබුවන් මානව හිමිකම් නිලධාරි III ශ්‍රේණිය සඳහා බඳවාගනු ලැබේ. බඳවාගනු ලබන්නන් වසර 3ක පරිවාස කාලයකට යටත් වන අතර, පරිවාස කාලය සාර්ථකව අවසන් කරන අයවලුන් තනතුරේ ස්ථිර කිරීමට කටයුතු කරනු ලැබේ.

තනතුරේ උසස්වීම් හා අනෙකුත් ප්‍රතිලාභ මානව හිමිකම් නිලධාරි තනතුරේ බඳවාගැනීමේ පරිපාටියට අනුව සිදු කරනු ලැබේ.

පහත දැක්වෙන ආකෘතිය අනුව A4 ප්‍රමාණයට සකස් කර සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023/11/21 දිනට පෙර ලේකම්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, අංක 14, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 04 ලිපිනයට ලැබෙන සේ තැපැල් මගින් යොමුකළ යුතු වේ.

ලේකම්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

2023. 10. 20